රු. 3000/-

197745
17/08/2010

# සාම්ප්‍රදායික උඩරට නර්තන කලාව පිළිබඳව සාමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්.

## (හලාවත අධ්‍යාපන කලාපයේ තෝරාගත් පාසල් ඇසුරින්)

රන්දෙණි කෝරාලලාගේ ගීතානි විජයමාලා මැණිකේ

Libary - USJP
197745

"ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා

සමාජ විද්‍යා විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධයයි"



197745

# පටුන


| | | | පිටු අංක |
|---|---|---|---|
| 1. | මාතෘකාව | - | i - ii |
| 2. | කතෘගේ ප්‍රකාශනය | - | iii |
| 3. | උපදේශකගේ ප්‍රකාශනය | - | iv |
| 4. | පිදුම | - | v |
| 5. | පටුන | - | vi - vii |
| 6. | ස්තුතිය | - | viii |
| 7. | සාරාංශය | - | ix - x |
| | **පළමු පරිච්ඡේදය** | | |
| 01. | හැඳින්වීම හා ක්‍රම විද්‍යාව | | |
| 1.1 | හැඳින්වීම | - | 1 - 4 |
| 1.2 | අධ්‍යයනයේ වැදගත්කම | - | 4 - 5 |
| 1.3 | පර්යේෂණ ගැටළුව | - | 5 - 6 |
| 1.4 | අධ්‍යයන අරමුණු | - | 6 - 7 |
| 1.5 | අධ්‍යයන ප්‍රදේශය | - | 7 |
| 1.6 | අධ්‍යයන මූලාශ්‍ර හා ක්‍රමවේද | - | 8 - 9 |
| 1.7 | අධ්‍යයන සංවිධානය | - | 10 |
| 1.8 | නාත්තන්ඩිය කොට්ඨාසයේ ඓතිහාසික තොරතුරු | - | 10 - 15 |
| | **දෙවන පරිච්ඡේදය** | | |
| 02 | උඩරට නර්තන කලාවේ ආරම්භය හා විකාශනය | - | |
| 2.1 | නර්තනය හැඳින්වීම | - | 16 - 21 |
| 2.2 | ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන නර්තන සම්ප්‍රදායන් | - | 21 - 22 |
| නර්තන කලාවේ විකාශනය කෙරෙහි බලපාන | | - | 22 - 35 |
| | ලද යුග ආශ්‍රිත තොරතුරු | | |
| | **තුන්වන පරිච්ඡේදය** | | |
| 3.1 | උඩරට නර්තන විෂය ක්ෂේත්‍රය තුළ අන්තර්ගත සමාජ හා සංස්කෘතික වටිනාකම | - | 36 - 38 |
| 3.2 | උඩරට නැටුමේ ඇති සරඹ/හරඹ | - | 38 |
| 3.3 | උඩරට වන්නම් | - | 38 - 43 |
| 3.4 | උඩරට වෙස් ඇඳුම් කට්ටලය | - | 43 - 44 |
| 3.5 | උඩරට වට්ටම් | - | 45 |
| 3.6 | උඩරට නර්තන කලාව හා බැඳුණු ශාන්ති කර්ම | - | 45 - 67 |
| 3.7 | සොකරි ගැමි නාටකය | - | 67 - 69 |
| 3.8 | උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ජන නැටුම් | - | 69 - 70 |
| 3.9 | බෞද්ධාගමික නැටුම් | - | 70 - 72 |
| 3.10 | උඩරට නර්තන සම්ප්‍රදාය හා බැඳි ජන ගායනා | - | 72 - 78 |
| 3.11 | සිංහල අවනද්ධ භාණ්ඩ | - | 78 - 81 |
| 3.12 | පිරිත් පිංකම | - | 82 |
| 3.13 | දොරකඩ අස්න | - | 83 - 84 |

# සාම්ප්‍රදායික උඩරට නර්තන කලාව පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

## රන්දෙණි කෝරාලලාගේ ගීතානි විජයමාලා මැණිකේ

## "නිබන්ධ සාරංශය"

උඩරට නර්තන කලාව දේශීය සංස්කෘතිය විදහාපානු ලබන ප්‍රධානතම සංස්කෘතික අංගයකි. පරම්පරානුගතව පැවත ගෙන ආ මෙම නර්තන කලාව ගත් කළ මුලුමනින් ම පාහේ සමාජ විද්‍යාත්මක ස්වරූපයක් ද්වනිත කරයි. එම නිසාම වර්ෂ ගණනාවක් යන තුරුම උඩරට නර්තන කලාව සමාජ සංස්ථාවන් තුළ වර්ධනය වෙමින් ව්‍යාප්ත වන්නට පටන් ගැනිනි. උඩරට නර්තන කලාව සමාජයේ තුළ ඇති කරනු ලබන එකී කාර්යභාරය හේතු කොටගෙන සමාජමය වශයෙන් එයට අද්විතීය ස්ථානයක් මුල් වන්නට පටන් ගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් පසු කාලීනව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විෂයක් වශයෙන් දැයේ දරුවන්ට ඉගෙන ගැනීමට අවස්ථාව උදාවිය. මෙම අධ්‍යයනය තුළින් අපේක්ෂා කරනු ලැබීයේ එකී පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළින් නර්තන විෂය තුළ අන්තර්ගත සාම්ප්‍රදායික ලක්ෂණ හා සමාජ විද්‍යාත්මක ලක්ෂණයන්හී සුරක්ෂිත බවක් ඇති වී තිබේද යන්න පිළිබඳව සොයාබැලීමත් එවැන්නක් සිදුනොවන්නේ නම් ඒ කෙරෙහි බලපානු ලබන හේතු සාධක මොනවාද යන්නත් පිළිබඳව සොයා බැලීමකි. ඒ සඳහා මෙම අරමුණු ඉටුකර ගැනීමේදී පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳව අවධානය යොමුකිරීමට සිදුවිය. එනම් නර්තනය හැඳින්වීම හා සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් යන්න කුමක්ද යන්න පිළිබඳ හැඳින්වීමක් දෙවන පරිච්ඡේය තුළින් උඩරට නර්තන කලාවේ ආරම්භය හා විකාශනය පිළිබඳවත් තුන්වන පරිච්ඡේදය තුළින් සාම්ප්‍රදායික උඩරට නර්තන කලාව විෂය ක්ෂේත්‍රය හා ඒ තුළ අන්තර්ගත සමාජ විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය කිරීමත් හතරවන පරිච්ඡේදය තුළින් පාසල් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී නර්තන විෂය සුරක්ෂිත භාවයත් හා සමාජගත කිරීමත් සිදුවීද යන්න පිළිබඳවත් සොයාබලන ලදී. අවසානයේදී ඉහත සඳහන් සියලු සාධක මුල්කොට ගෙන විෂය සුරක්ෂිතභාවයට මෙන්ම

සමාජයට වැඩදායක අයුරින් සකස් වී තිබේද එසේ සිදුවී නොමැති නම් ගත හැකි පියවරයන් පිළිබඳවත් නිගමන හා යෝජනා කිහිපයක් ගෙනහැර දක්වන ලදී.

මෙම කාර්යයේදී ප්‍රධාන වශයෙන් පාසල් තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදුවන ආකාරය සොයාබැලීම පිළිබඳවත්, ගුරු සිසු ගැටළු හඳුනා ගැනීමත්, පාසල් ප්‍රජාව නර්තන විෂය පිළිබඳව දක්වන ආකල්ප හඳුනා ගැනීමත්, රජය මඟින් විෂය සංවර්ධනය කෙරෙහි දක්වන දායකත්වය ප්‍රමාණවත් වේද යන්න සොයා බැලීමත් මෙන්ම නිලධාරීන්, විෂය හා බැඳි ශිල්පීන්, වැඩිහිටියන් හා විවිධ ආයතන මඟින් සිදුවන කාර්යයභාරය හඳුනා ගැනීමත් යනාදි ක්ෂේත්‍ර කිහිපයක් ඔස්සේ කරුණු විග්‍රහ කිරීමක් සිදුකර තිබේ.

මෙම සඳහා දත්ත රැස්කිරීමේ දී නියදිය වශයෙන් හලාවත අධ්‍යාපන කලාපයේ නාත්තන්ඩිය අධ්‍යාපන කොට්ඨාසයට අයත් පාසල් පහලවක් ද විදුහල්පතිවරුන්, ගුරුභවතුන්, සිසුන්, දෙමාපියන් හා ප්‍රදේශයේ නර්තන විෂය උගන්වන කලායතන, විෂය ප්‍රවීන පුද්ගලයින් මෙන්ම කලාප අධ්‍යාපන කාර්යාලයේ අධ්‍යක්ෂකවරු ද තෝරා ගැනින.

මෙහිදී දත්ත රැස්කිරීම සඳහා ප්‍රාථමික මූලාශ්‍ර හා ද්විතීක මූලාශ්‍ර යොදාගත් අතර ප්‍රශ්නාවලි ක්‍රමය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමය හා සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රමය දත්ත රැස්කිරීමේ ක්‍රමවේද වශයෙන් යොදා ගැනින.

මේ ආකාරයෙන් ලබාගත් දත්ත අනුව පැහැදිලි වූයේ උඩරට නර්තන කලාව තුළ අන්තර්ගත වන්නා වූ සමාජ විද්‍යාත්මක මූලධර්ම පාසල් අධ්‍යාපන පද්ධතිය තුළින් ගිලිහී යාමේ අවකාශයක් නිර්මාණය වී තිබෙන බවයි. එම නිසා එකී කරුණු පාදක කර ගනිමින් විෂය සුරක්ෂිතභාවය උදෙසා නිගමන හා යෝජනා රාශියක් ගෙනහැර දැක්වීමට මෙමගින් හැකියාව ලැබිණි.